<u>නුගේගොඩ දිසා අධිකරණයේදී ය.</u>

සනත් කුමාර අතුකෝරල
බී/5, මද්දුමගේවත්ත,
හයිලෙවෙල් පාර,
නුගේගොඩ.

<u>පැමිණිලිකරු</u>

නඩු අංකය	-
කාර්ය පටිපාටිය	- සාමාන්‍ය
ස්වභාවය	- විශේෂ
වටිනාකම	- රු. මිලියන 5 යි.

<u>එදිරිව</u>

1. ඩී. සී. එල්.
   දියගුආරච්චි
   කථිකාචාර්ය
   කළමනාකරණ හා මූල්‍ය
   පීඨය කොළඹ විශ්ව
   විද්‍යාලය අංක 166,
   බෞද්ධාලෝක මාවත,
   කොළඹ 07.

2. ඩබ්ලිව්. ජී. ප්‍රේමරත්න
   කථිකාචාර්ය
   කළමනාකරණ හා මූල්‍ය
   පීඨය කොළඹ විශ්ව
   විද්‍යාලය අංක 166,
   බෞද්ධාලෝක මාවත,
   කොළඹ 07.

3. සෂිකා ආර්. අබේදීර
   මනෝරත්න
   අංශ ප්‍රධානී
   කළමනාකරණ හා මූල්‍ය
   පීඨය කොළඹ විශ්ව
   විද්‍යාලය අංක 166,
   බෞද්ධාලෝක මාවත,
   කොළඹ 07.

4. එච්. එම්. නිහාල්
   හෙන්නායක
   පීඨාධිපති
   කළමනාකරණ හා මූල්‍ය
   පීඨය කොළඹ විශ්ව
   විද්‍යාලය අංක 166,
   බෞද්ධාලෝක මාවත,
   කොළඹ 07.

5. වජිරා හපුහින්න
   ජයරත්න අතිරේඛ
   ලේඛකාධිකාරී (විභාග
   අංශය)
   "විද්‍යාල මන්දිරය"
   අංක 94,
   කුමාරතුංග මුනිදාස මාවත,
   කොළඹ 03.

6. එච්. ඩී. කරුණාරත්න
   හිටපු උපකුලපති
   කොළඹ විශ්ව විද්‍යාලය
   අංක 166,
   බෞද්ධාලෝක මාවත,
   කොළඹ 07.

7. ඉන්දික මහේෂ්
   කරුණාතිලක
   උපකුලපති
   කොළඹ විශ්ව විද්‍යාලය
   "විද්‍යාල මන්දිරය"
   අංක 94,
   කුමාරතුංග මුනිදාස මාවත,
   කොළඹ 03.

8. නීතිපති
   නීතිපති
   දෙපාර්තමේන්තුව
   කොළඹ 12.

<u>**විත්තිකරුවන්**</u>

වර්ෂ 2026 ක් වූ අගෝස්තු මස 06 වන දින දිය.

ඉහත නම් සඳහන් පැමිණිලිකරු සිය **නීතිඥ ඩී.පී දනෝෂා පී. පෙරේරා මහත්මිය** මගින් පෙනී සිටිමින් ඉදිරිපත් කරනු ලබන පැමිණිල්ලෙන් පහත සඳහන් පරිදි ප්‍රකාශ කර සිටී.

1. ඉහත නම් සඳහන් පැමිණිලිකරු පදිංචිව සිටින්නේ මෙම ගරු අධිකරණයේ ප්‍රාදේශිය අධිකරණ බල සීමාව තුල වන බැවින් මෙම නඩුව අසා තීන්දු කිරීමට මෙම ගරු අධිකරණයට ප්‍රාදේශිය අධිකරණ බලය ඇති බව මෙම පැමිණිලිකරු ප්‍රකාශ කර සිටී.

2. පැමිණිලිකරු ප්‍රකාශ කර සිටින්නේ, පැමිණිලිකරු ව්‍යාපාරිකයෙක් වන බවයි.

3. පැමිණිලිකරු ප්‍රකාශ කර සිටින්නේ, 2023 වර්ෂයේ මුල් කාලසීමාව තුළ කොළඹ විශ්ව විද්‍යාලයේ කළමනාකරණ හා මූල්‍ය පීඨය මගින් ව්‍යවසායකත්ව සහ කුඩා ව්‍යාපාර කළමනාකරණ උසස් ඩිප්ලෝමා පාඨමාලාව (2022/2023) (SLQF Level 04) සඳහා අයදුම්පත් කැඳවන ලද බවයි.

4. පැමිණිලිකරු ප්‍රකාශ කර සිටින්නේ, කොළඹ විශ්ව විද්‍යාලයේ එකී අර්පණය පිළිගනිමින් පැමිණිලිකරු අදාල පාඨමාලාව සඳහා අයදුම්පත්‍රයක් ඉදිරිපත් කිරීමට තීරණය කරන ලද බවයි.

5. පැමිණිලිකරුගේ අයදුම්පත්‍රය පිළිගනිමින් කොළඹ විශ්ව විද්‍යාලයේ කළමනාකරණ හා මූල්‍ය පීඨය විසින් අදාල පාඨමාලාව හැදෑරීම සඳහා පැමිණිලිකරු තෝරා ගන්නා ලද බව පැමිණිලිකරු ප්‍රකාශ කර සිටී.

6. ඒ අනුව පැමිණිලිකරු සියළු මූලික කොන්දේසි සපුරමින් සම්පූර්ණ පාඨමාලා ගාස්තුවද නියමිත පරිදි ගෙවන ලද බව පැමිණිලිකරු ප්‍රකාශ කර සිටී.

7. පැමිණිලිකරු ප්‍රකාශ කර සිටින්නේ, ඒ අනුව ඉහත 03 සිට 06 දක්වා වූ ඡේදවල විස්තර කරන ලද කරුණු ප්‍රකාරව පැමිණිලිකරු හා කොළඹ විශ්ව විද්‍යාලය අතර ගිවිසුම්ගත බැඳීමක් සංස්ථාපනය වූ බවයි.

පැමිණිලිකරු විසින් අදාල පාඨමාලාව සඳහා ගාස්තු ගෙවන ලද බව තහවුරු කෙරෙන ලේඛන 2 ක් *X1* හා *X2* ලෙස ලකුණු කරමින් මේ සමග ඉදිරිපත් කර සිටී.

8. එකී ගිවිසුම්ගත බැඳීම ප්‍රකාරව, පැමිණිලිකරු හා කොළඹ විශ්ව විද්‍යාලය අතර ලිඛිතව, අලිඛිතව, සෘජුව හා ව්‍යංගයෙන් පහත සඳහන් එකගතාවයන් ඇති වූ බව පැමිණිලිකරු ප්‍රකාශ කර සිටී. එනම්,

   i. කොළඹ විශ්ව විද්‍යාලයේ කළමනාකරණ හා මූල්‍ය පීඨය මගින් ව්‍යවසායකත්ව සහ කුඩා ව්‍යාපාර කළමනාකරණ උසස් ඩිප්ලෝමා පාඨමාලාව (2022/2023) (SLQF Level 04) නිසි පරිදි පැවැත්වීමටත්,

   ii. එකී පාඨමාලාවට අදාල විභාග කටයුතු සහ කුසලතා නිර්ණය කිරීම (assessments) සාධාරණව හා පාරදෘෂ්‍යභාවයෙන් යුතුව සිදු කිරීමටත්,

   iii. එකී පාඨමාලාව හදාරනු ලබන ශිෂ්‍යයන් සමග ඇති පුද්ගලික හිතවත්කම් ලකුණු දීමේ ක්‍රියාපටිපාටියට අදාල නොකර ගැනීමටත්,

   iv. අවසානයේදී එක් එක් සිසුන්ට සිය දක්ෂතා හා කුසලතා මත පමණක් පදනම් වෙමින් සාධාරණ ලෙස ලකුණු ලබා දීමට සහ ශ්‍රේණිගත (grading) කිරීමටත්ය.

9. පැමිණිලිකරු ප්‍රකාශ කර සිටින්නේ, ව්‍යවසායකත්ව සහ කුඩා ව්‍යාපාර කළමනාකරණ උසස් ඩිප්ලෝමා පාඨමාලාව (2022/2023) (SLQF Level 04) එක් වසරක පාඨමාලාවක් වන බවයි.

10. එකී පාඨමාලාව සෙමෙස්ටර (semester/අදියර) 2 කින් යුතු වන බවද පැමිණිලිකරු ප්‍රකාශ කර සිටී.

11. පැමිණිලිකරු ප්‍රකාශ කර සිටින්නේ, පළමු සෙමෙස්තරය තුළදී විෂයන් 6 ක්ද, දෙවන සෙමෙස්තරය තුළදී විෂයන් 6 ක්ද ඉගැන්වීමට නියමිතව තිබූ බවයි.

12. පැමිණිලිකරු ප්‍රකාශ කර සිටින්නේ, පළමු සෙමෙස්තරය කිසිදු අර්බුධයකින් තොරව සාර්ථකව අවසන් වූ බවයි.

13. මෙම පැමිණිලිකරු ප්‍රකාශ කර සිටින්නේ, දෙවන සෙමෙස්තරය තුළදී ඉගැන්වීමට නියමිතව තිබූ HDESBM 508 සහ HDESBM 510 යන කේතයන් මගින් හදුන්වන ලද විෂයන් සම්බන්ධයෙන් අයුතු සහ අසාධාරණ තත්ත්වයන් ගණනාවක් ඇති බූ බවයි.

<u>HDESBM 508 යන කේතය මගින් හදුන්වන ලද විෂය (operations management for small businesses)</u>

14. පැමිණිලිකරු ප්‍රකාශ කර සිටින්නේ, HDESBM 508 යන කේතය මගින් හදුන්වන ලද විෂය උගන්වන ලද්දේ ඉහත නම් සදහන් 01 වන විත්තිකාරිය විසින් බවයි.

15. මෙම පැමිණිලිකරු ප්‍රකාශ කර සිටින්නේ, 01 වන විත්තිකාරිය මෙම නඩුවට විෂයගත පාඨමාලාව හදාරන ලද තවත් ශිෂ්‍යයෙක් වූ ලහිරු බණ්ඩාර යන අය සමග අයුතු හිතවත්කමක් ඇති කරගෙන තිබූ බවයි.

16. කරුණු එසේ තිබියදී 2024-02-02 වන දින හෝ ඊට ආසන්න දිනක එකී ලහිරු බණ්ඩාර යන අය මෙම පැමිණිලිකරු අමතා 01 වන විත්තිකාරියට මූල්‍යමය අවශ්‍යතාවයක් ඇතිව ඇති බැවින් ඇයගේ ගිණුමට රුපියල් 80,000/- ක මුදලක් බැර කරන ලෙසට ඉල්ලා සිටි බව මෙම පැමිණිලිකරු ප්‍රකාශ කර සිටී.

17. මෙම පැමිණිලිකරු ප්‍රකාශ කර සිටින්නේ, ඒ අනුව ලහිරු බණ්ඩාර යන අය විසින් 01 වන විත්තිකාරියගේ ගිණුම් අංකය පැමිණිලිකරු වෙත වට්ස්ඇප් මාර්ගයෙන් යොමු කරන ලද බවයි.

18. මෙම පැමිණිලිකරු ප්‍රකාශ කර සිටින්නේ, පැමිණිලිකරු 01 වන විත්තිකාරියගේ එකී ඉල්ලීම ප්‍රතික්ෂේප කරන ලද බවයි.

19. මෙම පැමිණිලිකරු ප්‍රකාශ කර සිටින්නේ, කොලඹ විශ්ව විද්‍යාලයේ කළමනාකරණ හා මූල්‍ය පීඨය මගින් ව්‍යවසායකත්ව සහ කුඩා ව්‍යාපාර කළමනාකරණ උසස් ඩිප්ලෝමා පාඨමාලාවට අදාලව 2024 මැයි මස 18 හා 19 යන දිනයන් හෝ ඊට ආසන්න දිනක "කිරිඇල්ල විජය රිසෝට්" නැමති හෝටලයේ වැඩමුළුවක් සංවිධානය කර තිබූ බවයි.

20. එකී වැඩමුළුවට තමා සහභාගී වූ බව පැමිණිලිකරු ප්‍රකාශ කර සිටී.

21. පැමිණිලිකරු ප්‍රකාශ කර සිටින්නේ, එකී වැඩමුළුවට 01 වන වින්තිකාරියද සහභාගී වූ බවත්, ඇය එකී වැඩමුළුව සඳහා සිය ස්වාමිපුරුෂයාද කැඳවා ගෙන එන ලද බවත්ය.

22. එම දින රාත්‍රියේදී පැමිණිලිකරු හා වෙනත් සිසුන් කිහිපදෙනෙක් නවාතැන්ගෙන සිටි කාමරයේම තම ස්වාමිපුරුෂයාට නැවතී සිටීමට ඉඩ ලබා දෙන ලෙසට 01 වන වින්තිකාරිය විසින් ඉල්ලීමක් කරන ලද බව මෙම පැමිණිලිකරු ප්‍රකාශ කර සිටී.

23. මෙම පැමිණිලිකරු ප්‍රකාශ කර සිටින්නේ, 01 වන වින්තිකාරියගේ එකී ඉල්ලීමද මෙම පැමිණිලිකරු විසින් ප්‍රතික්ෂේප කරන ලද බවයි.

24. පැමිණිලිකරු ප්‍රකාශ කර සිටින්නේ, ඒ අනුව 01 වන වින්තිකාරිය පැමිණිලිකරු කෙරෙහි අහිතවත්කමක් ගොඩ නගාගෙන සිටි බවයි.

25. පැමිණිලිකරු ප්‍රකාශ කර සිටින්නේ, කරුණු එසේ තිබියදී කොලඹ විශ්ව විද්‍යාලයේ කළමනාකරණ හා මූල්‍ය පීඨය මගින් මෙහෙයවන ලද ව්‍යවසායකත්ව සහ කුඩා ව්‍යාපාර කළමනාකරණ උසස් ඩිප්ලෝමා පාඨමාලාවට අදාල විභාග කටයුතු වලදී පැමිණිලිකරුට අසාධාරණයක් සිදු කරන බවට 01 වන වින්තිකාරිය විසින් ව්‍යංගව හා වක්‍රව මෙම පැමිණිලිකරුට දන්වා සිටි බවයි.

26. මෙම පැමිණිලිකරු ප්‍රකාශ කර සිටින්නේ, HDESBM 508 යන කේතය මගින් හඳුන්වන ලද විෂය සඳහා අවසාන වශයෙන් ලකුණු ලබා දීම පහත සඳහන් ආකාරයට සිදු කළ යුතුව තිබූ බවයි.

Assessments	Details of the Assignment	Weightage
Continuous Assessment	Reflective note (session 06) Presentation of Reflections (session 07)	35% 15%
Semester End Examination	Open book examination (Duration 2 hours)	50%
Total		100%

27. කෙසේ වුවද, 01 වන වින්තිකාරිය විසින් ලකුණු දීමේ ක්‍රමවේදය අත්තනෝමතික හා අසාධාරණ ලෙස වෙනස් කරන ලද අතර ඒ අනුව Continuous Assessment සඳහා ඇය විසින් ලකුණු ලබා දෙන ලද්දේ පහත සඳහන් ආකාරයට බව පැමිණිලිකරු ප්‍රකාශ කර සිටී.

Reflective note	30%
Presentation	20%
Total	50%

28. මෙම පැමිණිලිකරු ප්‍රකාශ කර සිටින්නේ, Reflective note සඳහා ලකුණු ප්‍රදානය කිරීමේදී 1 වන විත්තිකාරිය මෙම පැමිණිලිකරුට එරෙහිව ද්වේශ සහගතව හා පළිගන්නා චේතනාවෙන් යුතුව කටයුතු කර ඇති බව එකී Reflective note පරීක්ෂා කිරීමේදී මනාව තහවුරු වන බවයි.

29. මෙම පැමිණිලිකරු ප්‍රකාශ කර සිටින්නේ, HDESBM 508 යන කේතය මගින් හඳුන්වන ලද විෂය සඳහා අවසාන විභාගය පැවැත්වීමට පෙර දින රාත්‍රියේදී 01 වන විත්තිකාරිය විසින් ඇයට හිතවත් ශිෂ්‍යයෙක් සහ/හෝ ශිෂ්‍යයින්ට ප්‍රශ්න පත්‍රයේ ඇති ප්‍රශ්න අනාවරණය කරමින් අයුතු සහ අසාධාරණ සහායක්ද ලබා දී ඇති බවයි.

30. කරුණු එසේ තිබියදී කොළඹ විශ්ව විද්‍යාලය විසින් 2025-01-09 දිනැතිව ව්‍යවසායකත්ව සහ කුඩා ව්‍යාපාර කළමනාකරණ උසස් ඩිප්ලෝමා පාඨමාලාවට (2022/2023) (SLQF Level 04) අදාලව අවසන් ප්‍රතිපල ලේඛනය නිකුත් කරන ලද බව මෙම පැමිණිලිකරු ප්‍රකාශ කර සිටී.

31. පැමිණිලිකරු ප්‍රකාශ කර සිටින්නේ, එකී ප්‍රතිපල ලේඛනයට අනුව පැමිණිලිකරු HDESBM 508 යන කේතය මගින් හඳුන්වන ලද විෂය අසමත්ව (referred) ඇති බවයි.

32. ව්‍යවසායකත්ව සහ කුඩා ව්‍යාපාර කළමනාකරණ උසස් ඩිප්ලෝමා පාඨමාලාවට (2022/2023) (SLQF Level 04) අදාලව මේ ආකාරයෙන් සිදුවූ අනීතික හා අසාධාරණ තත්ත්වයන් සම්බන්ධයෙන් පැමිණිලිකරු දිගින් දිගටම විශ්ව විද්‍යාල පාලනාධිකාරියට සිය අප්‍රසාදය බළ කරන ලද බව පැමිණිලිකරු ප්‍රකාශ කර සිටී.

33. කරුණු එසේ තිබියදී කොළඹ විශ්ව විද්‍යාලය විසින් 2025-04-04 දිනැතිව ව්‍යවසායකත්ව සහ කුඩා ව්‍යාපාර කළමනාකරණ උසස් ඩිප්ලෝමා පාඨමාලාවට (2022/2023) (SLQF Level 04) අදාලව තෝරා ගන්නා ලද සිසුන් කිහිපදෙනෙකුට පමණක් අදාල වන ලෙස නැවත අතුරු ප්‍රතිපල ලේඛනයක් (provisional results) නිකුත් කරන ලද බව මෙම පැමිණිලිකරු ප්‍රකාශ කර සිටී.

34. එකී ලේඛනයට අනුව පැමිණිලිකරු අදාල පාඨමාලාව සමත්ව ඇති නමුත් ඔහුට කිසිදු ඉහළ සාමාර්ථයක් (distinction pass / merit pass) ප්‍රදානය කර නොමැති බව පැමිණිලිකරු ප්‍රකාශ කර සිටී.

35. පැමිණිලිකරු ප්‍රකාශ කර සිටින්නේ, ඉහත සඳහන් කරන ලද පළමු ප්‍රතිඵල ලේඛනය හා දෙවන ප්‍රතිඵල ලේඛනය අතර කිසිදු විභාගයක් නොපවත්වන ලද බවයි.

36. එසේ තිබියදී එකිනෙකට පටහැනි ප්‍රතිඵල ලේඛන 2 ක් නිකුත් කර ඇත්තේ කුමන හේතුවක් මතද යන්න කොලඹ විශ්ව විද්‍යාලය කිසිදු අවස්ථාවක පැහැදිලි කර නොමැති බව පැමිණිලිකරු ප්‍රකාශ කර සිටී.

37. ඒ අනුව කොළඹ විශ්ව විද්‍යාලය විසින් හුදෙක්ම පැමිණිලිකරු නිහඬ කිරීමේ කුට උපායක් වශයෙන් එලෙස පදනමක් නොමැති ප්‍රතිඵල ලේඛනයක් නිකුත් කර ඇති බව පැමිණිලිකරු ප්‍රකාශ කර සිටී.

38. කොළඹ විශ්ව විද්‍යාලයේ මෙම අනිතික හා අසාධාරණ ක්‍රියාකළාපය හේතුවෙන් පැමිණිලිකරුට ඉහළ සාමාර්ථයක් (distinction pass / merit pass) ලබා ගැනීමට තිබූ ඉඩකඩ වේතනාන්විතවම වළක්වා ඇති බව පැමිණිලිකරු ප්‍රකාශ කර සිටී.

<u>HDESBM 510</u> <u>යන කේතය මගින් හඳුන්වන ලද විෂය (**Business strategy and sustainability**)</u>

39. පැමිණිලිකරු ප්‍රකාශ කර සිටින්නේ, ඍඊඍඊ 510 යන කේතය මගින් හඳුන්වන ලද විෂය Business strategy සහ sustainability නැමති විෂයයන් දෙක මගින් සකස් කරන ලද විෂයයක් වන බවයි.

40. පැමිණිලිකරු ප්‍රකාශ කර සිටින්නේ, HDESBM 510 යන කේතය මගින් හඳුන්වන ලද විෂයට අදාලව sustainability නැමති විෂය කොටස උගන්වන ලද්දේ ඉහත නම් සඳහන් 02 වන විත්තිකරු බවයි.

41. HDESBM 510 යන කේතය මගින් හඳුන්වන ලද විෂයයට සමස්ථයක් ලෙස ලකුණු ලබා දීම පහත ආකාරයෙන් සිදුකළ යුතුව තිබූ බව පැමිණිලිකරු ප්‍රකාශ කර සිටී.

Final Exam	50%
Continuous assessement	50%
Total	100%

42. පැමිණිලිකරු ප්‍රකාශ කර සිටින්නේ, ඉහත වගුවේ දක්වා ඇති අවසාන විභාගයේදී ප්‍රදානය කරනු ලබන ලකුණු 50 ක ප්‍රමාණය ලකුණු 25 බැගින් ඉහත දක්වා ඇති විෂයයන් දෙකට බෙදා වෙන් කර තිබූ බවයි.

43. පැමිණිලිකරු ප්‍රකාශ කර සිටින්නේ, Continuous assessement සඳහා ප්‍රදානය කරනු ලබන ලකුණුද ආකාර දෙකකින් යුතු බව බවයි.

44. එනම්, Continuous assessement සඳහා ප්‍රදානය කරනු ලබන 50% ක් වූ ලකුණු ප්‍රමාණයද Business strategy සහ Sustainability නැමති විෂයයන් දෙක අතර සම සමව (ලකුණු 25 බැගින්) බෙදා වෙන් කර ඇති බව මෙම පැමිණිලිකරු ප්‍රකාශ කර සිටී.

45. එසේම Sustainability නැමති විෂය යටතේ අදාල ලකුණු 25 ක ප්‍රමාණය ලබා ගැනීම සඳහා අදාල සිසුන් එක්කෝ assignment නැතහොත් project යන කොටස් 2 න් එකක් තෝරා ගත යුතුව තිබූ බව මෙම පැමිණිලිකරු ප්‍රකාශ කර සිටී.

46. පැමිණිලිකරු ප්‍රකාශ කර සිටින්නේ, ඉහත කී project යන කොටස වෙනුවෙන් කොළඹ විශ්ව විද්‍යාලයේ කළමනාකරණ හා මූල්‍ය පීඨය මගින් කණ්ඩායම් ව්‍යාපෘතියක් සංවිධානය කර තිබූ බවයි.

47. එකී ව්‍යාපෘතිය සඳහා සෑම සිසුවෙකුටම රුපියල් 3500/- ක මුදලක් ගෙවන ලෙසට දැනුම් දී තිබූ බව පැමිණිලිකරු ප්‍රකාශ කර සිටී.

48. මෙම නඩුවට විෂයගත පාඨමාලාව හදාරන ලද තවත් ශිෂ්‍යයින් කිහිපදෙනෙක් වූ ලහිරු බණ්ඩාර, පසිනි බාලසූරිය, ටී. එම්. ගුණසේකර, ටී. ඩී. හටන්ගල යන අය සහ තවත් කිහිපදෙනෙක් අදාල ව්‍යාපෘතියට මුදල් ගෙවන ලද නමුත් එකී ව්‍යාපෘතිය සඳහා සහභාගී නොවූ බව පැමිණිලිකරු ප්‍රකාශ කර සිටී.

49. එසේ වුවද එකී සිසුන්ටද අදාල ව්‍යාපෘතිය සඳහා සහභාගී වූ අය ලෙස සළකා ලකුණු ප්‍රදානය කර ඇති බව පැමිණිලිකරු ප්‍රකාශ කර සිටී.

50. පැමිණිලිකරු ප්‍රකාශ කර සිටින්නේ, HDESBM 510 යන කේතය මගින් හඳුන්වන ලද විෂයට අදාලව 2024-08-25 වන දින විභාගය පැවැත්වුණු බවත්, එම විභාගය අවසානයේදී පී. ජී. ඒ බණ්ඩා නැමති ශිෂ්‍යයා උත්තර පත්‍රය සිය නිවසට ගෙන ගොස් ඇති බවත්, අනතුරුව ඊට පසු දින එකී උත්තර පත්‍රය නැවත ඉහත නම් සඳහන් 01 වන විත්තිකාරියට භාර දී ඇති බවත්, එසේම 01 වන විත්තිකාරිය එකී උත්තර පත්‍රය භාරගෙන ඇති බවත්ය.

51. අනතුරුව එකී ශිෂ්‍යයාට අදාල විෂය සඳහා Merit සාමාර්ථයක්ද ප්‍රදානය කර ඇති බව මෙම පැමිණිකරු ප්‍රකාශ කර සිටී.

52. ඒ අනුව HDESBM 510 යන කේතය මගින් හඳුන්වන ලද විෂයට අදාලව ලකුණු ලබා දීමේදිද බරපතල අක්‍රමිකතාවයක් සිදුව ඇති බව පැමිණිලිකරු ප්‍රකාශ කර සිටී.

53. මෙම පැමිණිලිකරු වැඩිදුරටත් පහත සඳහන් කරුණුද ප්‍රකාශ කර සිටී. එනම්,

i. 2025-01-09 දිනැතිව ව්‍යවසායකත්ව සහ කුඩා ව්‍යාපාර කළමනාකරණ උසස් ඩිප්ලෝමා පාඨමාලාවට (2022/2023) (SLQF Level 04) අදාලව අවසන් ප්‍රථිපල ලේඛනය නිකුත් කරන ලද බවත්,

ii. එකී ලේඛනයට අනුව ඩී. ඒ. අමරසේකර නැමති ශිෂ්‍යයා HDESBM 504 සහ HDESBM 508 යන විෂයන් දෙකම අසමත්ව ඇති බවත්,

iii. ඉන් අනතුරුව කිසිදු විභාගයක් නොපවත්වාම 2025-04-09 දිනැතිව නැවත ප්‍රථිපල ලේඛනයක් නිකුත් කරන ලද බවත්,

iv. එකී දෙවන ප්‍රථිපල ලේඛනයට අනුව ඩී. ඒ. අමරසේකර නැමති ශිෂ්‍යයා HDESBM 504 සහ යන විෂය අසමත්ව ඇති බවත්, HDESBM 508 යන විෂය සම්බන්ධයෙන් කිසිදු සදහනක් නොමැති බවත්,

v. එසේ තිබියදී 2026-05-21 දිනැතිව තවත් ප්‍රථිපල ලේඛනයක් නිකුත් කර ඇති අතර එකී ලේඛනයෙහි ඩී. ඒ. අමරසේකර නැමති ශිෂ්‍යයාට අදාලව HDESBM 504 සහ HDESBM 508 යන විෂයන් සම්බන්ධයෙන් කිසිදු සදහනක් නොමැති බවත්,

vi. එසේ වුවද කරුණු එසේ තිබියදී එකී ඩී. ඒ. අමරසේකර නැමති ශිෂ්‍යයාට උපාධි ප්‍රදානෝත්සවයේදී අදාල පාඨමාලාව සම්පූර්ණ කරන ලද බවට සහතික පත්‍රය ප්‍රදානය කර ඇති බවත්ය.

54. කොළඹ විශ්ව විද්‍යාලය විසින් සිදු කරන ලද මෙම අසාධාරණය සම්බන්ධයෙන් පැමිණිලිකරු සිය විරෝධතාවය සහ අප්‍රසාදය පළ කිරීමෙන් අනතුරුව කොලඹ විශ්ව විද්‍යාලය එකී චෝදනා සම්බන්ධයෙන් පරීක්ෂණයක් ආරම්භ කරන ලද බව පැමිණිලිකරු ප්‍රකාශ කර සිටී.

55. පැමිණිලිකරු ප්‍රකාශ කර සිටින්නේ, පැමිණිලිකරු දන්නා පරිදි එකී පරීක්ෂණය මේ වනතෙක් අවසන්ව නොමැති බවයි.

56. කරුණු එසේ තිබියදී සහ මෙම පැමිණිලිකරුගේ බලවත් විරෝධය හමුවේ කොළඹ විශ්ව විද්‍යාලය විසින් ව්‍යවසායකත්ව සහ කුඩා ව්‍යාපාර කළමනාකරණ උසස් ඩිප්ලෝමා පාඨමාලාවට

(2022/2023) (SLQF Level 04) අදාලව අවසාන සහතික පත්‍ර ප්‍රදානයද සිදු කරන ලද බව පැමිණිලිකරු ප්‍රකාශ කර සිටී.

57. පැමිණිලිකරු ප්‍රකාශ කර සිටින්නේ, මෙම පැමිණිල්ල මගින් ඉහත දීර්ඝ ලෙස විස්තර කරන ලද කොළඹ විශ්ව විද්‍යාලය මගින් සිදුකර ඇති අසාධාරණ, වංචනික, අනිතික හා නොසැළකිලිමත් ක්‍රියාවන් සඳහා ඉහත නම් සඳහන් 01 සිට 07 තෙක් වූ විත්තිකාර නිළධාරීන් එක්ව හා වෙන් වෙන්වද පුද්ගලිකව හා සෘජුවමද වගකීමට ලක්වන බවයි.

58. විශේෂයෙන්ම, ඉහත නම් සඳහන්

i. 01 වන හා 02 වන විත්තිකරුවන් ඉහත 03 සිට 06 දක්වා වූ ඡේදවල විස්තර කරන ලද ගිවිසුම්ගත බැඳීම උල්ලංගණය කරමින් පැමිණිලිකරුට අසාධාරණයක් වන ආකාරයට විභාග වංචාවන් හා අයුතු සැළකීම් හා චේතනාන්විත නොසළකා හැරීම් සිදු කර ඇති බවත්,

ii. 03 සිට 07 තෙක් විත්තිකරුවන් ඉහත 03 සිට 06 දක්වා වූ ඡේදවල විස්තර කරන ලද ගිවිසුම්ගත බැඳීම උල්ලංගණය කරමින් පැමිණිලිකරුට අසාධාරණයක් වන ආකාරයට විභාග වංචාවන් හා අයුතු සැළකීම් හා චේතනාන්විත නොසළකා හැරීම් සිදු කිරීම සඳහා 01 වන හා 02 වන විත්තිකරුවන්ට සහාය දක්වා ඇති බවත්ය.

59. මෙම පැමිණිලිකරු ප්‍රකාශ කර සිටින්නේ,

i. කොලඹ විශ්ව විද්‍යාලය රාජ්‍ය ආයතනයක් වන බවත්,

ii. එහෙත් එකී ආයතනය නෛතික පුද්ගලයෙක් නොවන බවත්,

iii. කොළඹ විශ්ව විද්‍යාලය හා පැමිණිලිකරු අතර හටගෙන ඇති ගිවිසුම්ගත බැඳීම එකී විශ්ව විද්‍යාලය විසින් උල්ලංඝණය කිරීම මත එකී ආයතනය වෙනුවෙන් නීතිපතිවරයා මෙම නඩුවට අත්‍යාවශ්‍ය පාර්ශවයක් වශයෙන් නම් කර ඇති බවයි.

60. ඒ අනුව පැමිණිලිකරු ප්‍රකාශ කර සිටින්නේ,

i. කොලඹ විශ්ව විද්‍යාලයේ කළමනාකරණ හා මූල්‍ය පීඨය මගින් පවත්වන ලද ව්‍යවසායකත්ව සහ කුඩා ව්‍යාපාර කළමනාකරණ උසස් ඩිප්ලෝමා පාඨමාලාව අසාධාරණ හා අනිතික ආකාරයට පවත්වන ලද පාඨමාලාවක් වන බවත්,

ii. එකී පාඨමාලාව සම්බන්ධයෙන් පැමිණිලිකරු හා එකී විශ්ව විද්‍යාලය අතර ඇති වූ ගිවිසුම්ගත බැඳීම එකී විශ්ව විද්‍යාලය විසින් අසාධාරණ ලෙස උල්ලංඝණය කර ඇති බවත්,

iii. එසේ හෙයින් ව්‍යාපාරිකයෙක් වශයෙන් එකී පාඨමාලාව හැදෑරීම මගින් පැමිණිලිකරු විසින් අපේක්ෂා කරන ලද ප්‍රතිඵල පැමිණිලිකරුට ලැබී නොමැති බවත්,

iv. ඒ අනුව පැමිණිලිකරු සිය ව්‍යාපාරික මිතුරන් සහ හිතවතුන් අතර සමච්චලයට ලක්ව ඇති බවත්,

v. එකී පාඨමාලාව හදාරා ඉහළ සාමාර්ථයක් ලබා ගැනීම සඳහා පැමිණිලිකරුට තිබූ අපේක්ෂාව කොළඹ විශ්ව විද්‍යාලයේ ක්‍රියාකළාපය මත විනාශ වී ගිය බවත්,

vi. ඒ අනුව එකී පාඨමාලාව සඳහා පැමිණිලිකරු විසින් වැය කරන ලද මුදල, ශ්‍රමය හා කාලය නිරපරාදේ නාස්ති වී ඇති බවත්,

vii. ඒ අනුව එකී පාඩුව වෙනුවෙන් රුපියල් මිලියන 5 ක වන්දි මුදලක් ලබා ගැනීම සඳහා මෙම පැමිණිලිකරුට අයිතිවාසිකම් ඇති බවත්ය.

61. පැමිණිලිකරු ප්‍රකාශ කර සිටින්නේ, ඒ අනුව ඉහත නම් සඳහන් විත්තිකරුවන්ට එරෙහිව නඩු පවරා වන්දි මුදලක් ලබා ගැනීම සඳහා මෙම පැමිණිලිකරුගේ වාසියට 2026-03-13 දිනැතිව නඩු නිමිත්තක් උපචය වී ඇති බවයි.

62. පැමිණිලිකරු ප්‍රකාශ කර සිටින්නේ, ඉහත සඳහන් කරන ලද වන්දි මුදල ගෙවා නිම කරන ලෙස එන්තරවාසි ලිපි මගින් විත්තිකරුවන්ට දැනුම් දී තිබුනද විත්තිකරුවන් විසින් එකී ලිපි පරිදි කටයුතු කිරීම පැහැර හැර ඇති බවයි.

63. පැමිණිලිකරු ප්‍රකාශ කර සිටින්නේ, මෙම නඩුවට අදාලව ඉහත නම් සඳහන් විත්තිකරුවන් වෙත සිවිල් නඩු විධාන සංග්‍රහයේ 461 වන වගන්තියේ ප්‍රතිපාදන ප්‍රකාරව නොතිසි ලබා දී ඇති බවයි.

64. පැමිණිලිකරු වැඩිදුරටත් ප්‍රකාශ කර සිටින්නේ, විත්තිකරුවන්ගේ අනීතික ක්‍රියාපටිපාටිය සම්බන්ධයෙන් පැමිණිලිකරු අල්ලස් හා දූෂණ කොමිෂන් සභාව වෙතද පැමිණිලි කර ඇති බවත්, ඒ අනුව එකී කොමිෂන් සභාව අදාල චෝදනාවන් සම්බන්ධයෙන් මේ වන විට විමර්ශනයක් ආරම්භ කර ඇති බවත්ය.

65. පැමිණිලිකරු මුද්දර ගාස්තු ගෙවීමේ කාර්යය සඳහා පමණක් මෙම නඩුව රුපියල් මිලියන 5 කට අගය කර සිටී.

<u>කරුණු එසේ හෙයින් පැමිණිලිකරු ගරු අධිකරණයෙන් ගෞරවයෙන් අයැද සිටින්නේ,</u>

A. කොළඹ විශ්ව විද්‍යාලයේ කළමනාකරණ හා මූල්‍ය පීඨය මගින් පවත්වන ලද ව්‍යවසායකත්ව සහ කුඩා ව්‍යාපාර කළමනාකරණ උසස් ඩිප්ලෝමා පාඨමාලාව සම්බන්ධයෙන් පැමිණිලිකරු හා එකී විශ්ව විද්‍යාලය අතර ඇති වූ ගිවිසුම්ගත බැඳීම (contractual obligation) එකී විශ්ව විද්‍යාලය විසින් අසාධාරණ ලෙස උල්ලංඝණය කර ඇති බවට අධිකරණමය ප්‍රකාශයක් ලබා දෙන ලෙසත්,

B. ඉහත නම් සඳහන් විත්තිකරුවන්ගෙන් එක්ව හා වෙන් වෙන්ව රුපියල් මිලියන 5 ක වන්දි මුදලක් පැමිණිලිකරු වෙත අය කරවා දෙන ලෙසත්,

C. නඩු ගාස්තු සහ,

D. ගරු අධිකරණයට මැනවැයි හැගෙන වෙනත් සහ වැඩිමනත් සහන ලබා දෙමින් පැමිණිලිකරුවන්ගේ වාසියට නඩු තීන්දුවක් සහ තීන්දු ප්‍රකාශයක් ලබා දෙන ලෙසත්ය.

පැමිණිලිකරුගේ නීතිඥ